# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/33 - 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ගොනු අංකය:* කදු/ඉඩම්/01/134/සීඊබී.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*:* 4/3/2016/සීඊබී/23.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන* *ඉඩම/පරවශ්‍යතාවේ *විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 476/ඒ මාලඹේ (බටහිර) ග්‍රාම නිලධාරී වසමේ මාළඹේ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.කො. 9811 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4199 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස්.

මූලික පිඹුරු අංක 9811 හි,

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ඇටහෙරලියගහකුඹුර; වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන අය: රජය;මුල් හිමිකම් කියන අය: එච්. ලීලාවතී සිල්වා මිය සහ තවත් අය අංක 148/4, " සෙත්සිරි", තලාහේන, මාළඹේ.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: ඇටහෙරලියගහකුඹුර;වර්තමාන ඉඩම් පරිහරණය:කුඹුර (අධිබලැති විදුලි කණු දෙකක් ඇත.); හිමිකම් කියන අය: රජය;මුල් හිමිකම් කියන අය: එස්.එල්. සූරියආරච්චි මයා, ඒ.ඒ. ආර්. ස්වර්ණා පෙරේරා මිය, ඒ. ඒ. ඉන්ද්‍රා කාන්ති පෙරේරා මිය, "රම්‍යා" පෝරේ, අතුරුගිරිය.

ඉහත සඳහන් *ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2019 ජූනි මස 26 වැනි දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 ජූනි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ.ඩී.වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කඩුවෙල.

06 - 108

1A - G 30145- 22 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

පරිසර සංරක්ෂණය සඳහා අත්පත් කර ගැනීමට නියමිත බලගොල්ලයාය නැමැති ඉඩමට අදාලව පළකරන ලද අංක 1438/6 හා 2006.03.27 දිනැති *ගැසට් පත්‍රයේ* භාෂාත්‍රයෙන් පළකර ඇති 7 වන වගන්තිය යටතේ දැන්වීම හා බැඳේ. එකී දැන්වීමේ විස්තර සඳහන් ඉඩම භූ.මු.පි. 13, පත්‍ර අංක 80, අතිරේක අංක 24 දරන පිඹුරේ කැබලි අංක 2056 ලෙස පෙන්වා දෙන අතර, මායිම් උතුරට: කැබලි අංක 1153 3/3 සහ 1167, නැගෙනහිර: කැබලි අංක 1168 සහ 1184, දකුණ: කැබලි අංක 1168 සහ 1184, බටහිර: කැබලි අංක 1184 සහ 1164 වේ. එකී ඉඩම් කොටසට අදාල හිමිකම් පරීක්ෂණය නැවත වරක් 2019.06.27 දින පෙ.ව. 10.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන බව දන්වා සිටිමි.

06 - 109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.